සාධාරණ සමාජයක් සඳහා වන ජාතික ව්‍යාපාරය
நீதியான சமுதாயத்திற்கான தேசிய இயக்கம்
National Movement for Social Justice





අංක 74, කිරුළපන ඇවනිව්, කොළඹ 05
இல 74, கிருலப்பனை அவென்யூ, கொழும்பு 05
No 74, Kirulapone Avenue, Colombo 05

0112512992 /0777751092 /0778021761
nmsjoffice2023@gmail.com


මාධ්‍ය නිවේදනය | Press Release | ஊடக வெளியீடு | 2026 / 03 / 06

**මානුෂිකත්වය පෙරදැරිව ඉරාන නාවිකයන්ට අදාලව රජය ගනු ලැබූ තීරණය සාධාරණ සමාජයක් සඳහා වන ජාතික ව්‍යාපාරය අගය කරන්නෙමු.**

ශ්‍රී ලංකාවට ඔබ්බෙන් වූ මුහුදේ දී ප්‍රහාරයට ලක්ව ඇති ඉරානයට අයත් එක් නෞකාවක සිටි තුවාල ලත් පුද්ගලයින් මුදවාගෙන වෛද්‍ය ප්‍රතිකාර ලබාදීමට සහ ඉරානයට ම අයත් තවත් එක් නෞකාවක සිටි නාවිකයන්ද ඇතුළු සියළුම දෙනා ශ්‍රී ලංකාව තුළට කැඳවා අවශ්‍ය ආරක්ෂාව ලබා දීමට ශ්‍රී ලංකාව ගත් පියවර මහත් සේ අගය කරන සාධාරණ සමාජයක් සඳහා වන ජාතික ව්‍යාපාරය ඒ පිළිබඳව ගරු ජනාධිපති අනුර කුමාර දිසානායක මැතිතුමා වෙත අපගේ ප්‍රසාදය පළ කරන්නෙමු.

රටක් වශයෙන් අප එහි දි ප්‍රදර්ශනය කර ඇත්තේ මානුෂිකත්වය පෙරටු කරගත් ශිෂ්ට සම්පන්න රාජ්‍ය තාන්ත්‍රික ක්‍රියා පිළිවෙතකි. එමෙන් ම ජාත්‍යන්තර වශයෙන් හට ගන්නා ඕනෑම ගැටුමක දි ශ්‍රී ලංකාවේ භූමිය, මුහුදු කලාපය හෝ ගුවන් කලාපය ගැටුම්වල පාර්ශ්වකරුවන් වන කවර හෝ රාජ්‍යයකට පක්ෂපාති ආකාරයට හෝ පීඩාවන් ගෙන දෙන ආකාරයට කටයුතු කිරීමට ඉඩක් නොදීමට රාජ්‍යයක් ලෙස ගෙන ඇති ස්ථාවරය ද අපි අගය කරන්නෙමු. නොබැඳි පිළිවෙත තුළ දීර්ඝ කාලයක් කටයුතු කර ඇති රටක් ලෙස ශ්‍රී ලංකාව ගෙන ඇති ස්ථාවරය අපගේ ඉතිහාසයට අනුව ද, සදාචාරාත්මක දේශපාලන වටිනාකම්වලට ද සපුරාම අනුගත වූවකි.

ගෝලීය වශයෙන් මානව සමාජය මහත් ආතතියකට පත්ව ඇති මෙවන් අවස්ථාවක ශ්‍රී ලංකාව ගත් මෙම පියවර සාධාරණ සමාජයක් සඳහා වන ජාතික ව්‍යාපාරය නැවතත නැවතත් අගය කරන අතර ඉන්දියන් සාගරය සාම කලාපයක් කරගැනීම සඳහා ගරු සිරිමාවෝ බණ්ඩාරනායක මැතිණියගේ යෝජනාව පරිදි දීර්ඝ කාලීන ශ්‍රී ලාංකීය අපේක්ෂාව සාක්ෂාත් කරගැනීම සඳහා කලාපයේ අනෙකුත් රටවල් සමඟ ද සාමූහිකව පෙනී සිටිමේ අවශ්‍යතාවය කෙරෙහි ද ගරු ජනාධිපතිතුමාගේත්, රජයේත් අවධානය යොමු වනු ඇතැයි අපි අපේක්ෂා කරන්නෙමු.

**ශ්‍රී ලංකාභිමාන්‍ය කරු ජයසූරිය**